# මහජන පුස්තකාලය - අම්බලන්ගොඩ

❖ අම්බලන්ගොඩ මහජන පුස්තකාලය

විමර්ශන අංශය, බැහැරදීමේ අංශය, ළමා අංශය, සඟරා අංශය සතියේ දින හතම පෙ.ව. 7.30 සිට ප.ව. 6.30 දක්වා විවෘතව පවතී.
(රජයේ නිවාඩු දින සහ පොහොය දින පුස්තකාලය වසා ඇත.)

❖ **අම්බලන්ගොඩ නගරයේ ස්ථිර පදිංචි කරුවන්හට පමණක් පුස්තකාල නිත්‍ය සාමාජිකත්වය ලබා දෙනු ඇත.**

පාසල් සිසුන් සඳහා ළමා සාමාජිකත්වය 08 වසර දක්වා ලබා දෙනු ලැබේ.
(වයස අවු: 10 – 14 දක්වා)

- සාමාජික අයදුම්පත -රු: 5.00
- වැඩිහිටි සාමාජිකයන් සඳහා ඇපතැන්පතුව -රු: 100.00
- පාසල් සිසුන් සඳහා _රු: 50.00
- වසර 03 ඇතුළත මෙම සාමාජිකත්වය අලුත් කල යුතුය.
- සාමාජිකත්වය අලුත් කිරීම සඳහා -රු:10.00

❖ වැඩිහිටි සාමාජිකයන් සඳහා ඇපකරුවන් ලෙස අම්බලන්ගොඩ නගර සීමාවේ වරිපනම් බදු ගෙවන පුද්ගලයෙකු (තමාගේ නමට වරිපනම් තිබිය යුතුය.) සහ කොට්ඨාස භාර නගර සභා මන්ත්‍රීවරයෙකු හෝ ග්‍රාමනිලධාරීවරයෙකු සහතික කල යුතුය.

- පාසල් සිසුන් සඳහා (අවු:10 සහ අවු :14 දක්වා ළමා සාමාජිකයින්ට) පාසලේ විදුහල්පතිතුමාගේ නිර්දේශය ලබා ගත යුතුය.

❖ පාඨකයින්ගේ වගකීම .

❖ පාඨකයන් පුස්තකාලයේ නීති රීති වලට එකඟ විය යුතුය.

❖ අදාළ තොරතුරු මධ්‍යස්ථානයේ ඇති දේපළ වලට හානි පැමිණීමෙන් වැළකීම.

❖ සාමාජිකත්වය ලැබීම/ අලුත් කිරීම/ ප්‍රමාද ගාස්තු අය කිරීම සහ වෙනත් අය කිරීම් වලදී පාඨක සභය ආයතනයේ කාර්ය මණ්ඩලයට ලබා දීම අවශ්‍ය වේ.

❖ පුස්තකාලාධිපති හෝ අදාළ කාර්ය මණ්ඩලයේ අවසරයකින් තොරව පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ ඇති තාක්ෂණික මෙවලම් පරිහරණය නොකිරීම.

❖ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සුහදව කටයුතු කිරීම.

❖ ප්‍රදේශයේ සහ ආයතනයේ පවතින තොරතුරු මධ්‍යස්ථානය පුස්තකාලය බව පාඨකයාට තේරුම් ගැනීමට සැලසීම.

❖ පුස්තකාලය විසින් සංවිධානය කරන විවිධ වැඩසටහන් වලදී පාඨකයන්ට ද යම් දායකත්වයක් ලබා දීමට හැකි බව අවබෝධ කර ගැනීම සඳහා තොරතුරු සම්පත් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කර ගැනීම සඳහා උදව් වීම.

සාමාජික අංකය:

## සාමාජික පත් නිකුත් කිරීම - අම්බලන්ගොඩ මහජන පුස්තකාලය.

මෙහි පහත අත්සන් කරන මා අම්බලන්ගොඩ මහජන පුස්තකාලයේ පොත් බැහැර ගෙන යන අංශයේ සාමාජිකත්වය ලබා සිටින්නෙමි.

එක් සාමාජිකයෙකුට එකවර පොත් දෙකක් බැහැර ගෙන යා හැකි වන පරිදි අනුගමනය කරන ක්‍රමය යටතේ නිකුත් කරන සාමාජික ටිකට් පත් දෙකක් අද දින භාර ගන්නට යෙදුනෙමි.

අද සිට මාගේ සාමාජිකත්වය අවලංගු වන දිනය තෙක් පහත සඳහන් කොන්දේසි වලට මා බැඳී සිටින බව මා හොඳාකාරව දනිමි.

01. එම සාමාජික ටිකට් පත් අන් අයෙකුට නොපැවරීම.

02. ඒවා පුස්තකාල භාරකාරාදීන් වෙත භාර කරමින් ලබා ගන්නා පොත්වල සම්පූර්ණ වගකීම මා විසින් ගැනීම.

03. සාමාජික ටිකට් පත් මගේ ආරක්ෂාවෙන් නැති වූ අවස්ථාවක ඒ බව පුස්තකාල භාරකාරාදීන් වෙත වහාම දැනුම් දීම හා එසේ දැනුම් දෙන විට යම් හෙයකින් එම සාමාජික ටිකට් පත් සඳහා ලබා ගෙන ඇති පොත්වල වගකීම මා විසින් ඉසිලීම.

04. වැස්සෙන්, අව්වෙන් හෝ ඩහදිය ආදියෙන් පොත් ආරක්ෂා කරගෙන හැකිතාක් පිරිසිදුව පාවිච්චි කිරීම.

05. මගේ තැපැල් ලිපිනය වෙනස් වූ වහාම පුස්තකාල භාරකාරාදීන් වෙත දැනුම්දීම.

06. ව්‍යවස්ථානුකූලව නියම කරනු ලබන දඩ හෝ අලාභ හානි පිළිබඳ මුදල් ගෙවීමෙන් හෝ පුස්තකාල සේවය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුස්තකාල භාරකාරාදීන් විසින් සාමාජිකයෙකු වශයෙන් මගෙන් අපේක්ෂා කරන අන් හැම සහයෝගයක්ම නොමසුරුව දීමටත් මම කැමැත්තෙමි.

දිනය :- ..............................

..................................
සාමාජිකයාගේ අත්සන